www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාව: නැවත පත්වූ කොංග්‍රසය ප්‍රමුඛ රජය ආයෝජන හිතවාදී "ප්‍රතිසංස්කරන" කඩිනම් කරයි

## India: Re-elected Congress-led government to accelerate pace of pro-investor "reforms"

**කීත් ජෝන්ස් විසිනි**
**2009 මැයි 18**

මාසයක් පුරා පියවර කිහිපයකින් පැවැති ඉන්දීය මැතිවරනයේ දී කොංග්‍රසය ප්‍රමුඛ එක්සත් ප්‍රගතිශීලී සන්ධානය (යූපීඒ) ආන්ඩුබලය රැකගැනීමට සමත් විය. ආසන 543කින් යුත් ලෝක් සභාවේ තනි බහුතරයක් ලබා ගැනීමට එයට අඩු වූයේ ආසන 13ක් පමනි.

යූපීඒ හි - විශේෂයෙන්ම සංසන්දනාත්මකව ආසන 60 න් 205 දක්වා වැඩි කර ගත් කොංග්‍රස් පක්ෂයේ ශක්තිමත් ඉදිරිපත් වීම - කොංග්‍රස් නායකත්වය ද ඇතුලත් දේශපාලන සංස්ථාපිතය බලා පොරොත්තු වූවාට වඩා වැඩි ප්‍රතිඵලයක් අත් කර ගත්තේය. අස්ථාවර ආන්ඩුවක් අපේක්ෂා කරමින් සෙනසුරාදා ඡන්ද ගනන් කිරීමට පෙර දිනවල දී ප්‍රතිවාදී ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය (එන්ඩීඒ) හා තෙවන පෙරමුන යන දෙ කොටස සමග ම පෙල ගැසී සිටින පක්ෂ වෙත කොංග්‍රසය ඉතා ප්‍රසිද්ධියේ ම ආරාධනා කලේය. "මෙවන් ප්‍රතිඵලයක් අප අපගේ වියරුම සිහිනයකදී වත් බලාපොරොත්තු නොවුනේ ය " යි කොංග්‍රසයේ "ප්‍රධාන මූලෝපායඥයෙක් " හින්දු පත්‍රයට ප්‍රකාශ කලේ ය.

කොංග්‍රස් පක්ෂයේ සභාපති සෝනියා ගාන්ධි හා අගමැති මන්මෝහන් සිං මැතිවරන ප්‍රතිඵල "සුවිසල් වරමක්" බව නිවේදනය කිරීමට යුහුසුලු විය. මෙය මුලුමනින්ම අතිශෝක්තියකි. මැතිවරන කොමිසම තවමත් අවසන් ප්‍රතිඵල නිවේදනය කල යුතුව ඇත. එහෙත් මූලික සංඛ්‍යාලේඛන පෙන්නුම් කරන්නේ 2004 මැතිවරනයේ දී ලබා ගත් ඡන්ද ප්‍රමානය යන්තම් සියයට 2ට මඳක් වැඩි ප්‍රමානයකින් ඉහල දමා ගනිමින් මෙවර ඡන්දයේ දී ඔවුන්ගේ කොටස සියයට 28.5ක් කර ගැනීමට කොංග්‍රසයට හැකිව ඇති බවය.

කොංග්‍රස් පක්ෂයත් යූපීඒ රජයත් මැතිවරනයේ දී බොහෝ සේ ශක්තිමත්ව ඉස්මතු වී ඇති බව කියනු ලබයි. භාරතීය ජනතා පක්ෂය නායකත්වය දෙන එන්ඩීඒ සංවිධානය ඇතුලුව ප්‍රධාන විපක්ෂ සංධානයේ සියලු පක්ෂ ලබා ගත්තාට වඩා, ආසන 50ක් කොංග්‍රසය තනිව ම දිනා ගත්තේ ය.

ප්‍රධාන විපක්ෂ සන්ධානයේ භාරතීය ජනතා පකෂය (බීජේපී) ප්‍රමුඛ එන්ඩීඒ හා තෙවන පෙරමුන වෙතින් ආධාරකරුවන් කඩා ගැනීමේ අවස්ථාවත් ඇතුලුව ඔවුන්ගේ පාර්ලිමේන්තු පාක්ෂිකයන් අවශ්‍ය පරිදි තෝරා ගැනීමේ සුව පහසුව කොංග්‍රස් පක්ෂයට ලැබී ඇත. එසේම එයට දැන් විරුද්ධ පක්ෂයේ ආසනවලට ඇද වැටී සිටින එකක් හෝ ඊට වැඩි පක්ෂ ගනනක් විසින් ඔවුන්ව පහසුවෙන් විස්ථාපනය කරනු ඇතැයි යන තර්ජනය සහිතව එහි හවුල්කරුවන් වන ප්‍රාදේශීය හා කුල පදනමක් සහිත පක්ෂ රඳවා තබාගැනීමට හැකිවනු ඇත. මෙම පක්ෂ එකකටවත් ආසන 19කට වඩා නැත.

ඉන්දියානු මහා සංගත මැතිවරන ප්‍රතිඵල වර්නනා කර ඇති අතර ආයෝජන හිතවාදී "ප්‍රතිසංස්කරන" ක්‍රියාත්මක කිරීම නාටකීයව වේගවත් කිරීමට මේ නව දේශපාලන බලය යොදා ගත යුතු බව අවධාරනය කරමින් සිටී. කර්මාන්ත ශාලා වසා දැමීමට හා පිටතට කොන්ත්‍රාත්දීමට පවතින සීමා ඉවත් කිරීම, පොදු ඒකක (රජය සතු සංගත) සම්පූර්නයෙන් හෝ කොටස් වශයෙන් විකුනා දැමීම, භාන්ඩ බෙදා හැරීමේ අංශයේ විදේශීය ආයෝජන සඳහා වැඩිපුර අවස්ථා සැලසීම, උත්පාතයක ඇති ආයුධ කර්මාන්තය පෞද්ගලික ආයෝජන සඳහා විවෘත කිරීම හා බැංකු සහ මූල්‍ය සේවා (විශ්‍රාම වැටුප් හා රක්ෂන) රෙකුලාසි ඉවත් කිරීම ඒවා අතර වේ.

වානිජ්‍ය හා කර්මාන්ත පිලිබඳ ඉන්දියානු මන්ඩලයේ සභාපති හර්ෂ් පටි සිංගානියා "අපට පැහැදිලි හා නොබිඳුනු තීන්දුවක් ලැබීම සම්බන්ධයෙන් කර්මාන්ත අංශය සතුටු වේ... මෙය රජයට ඉක්මන් හා තීරනාත්මක පියවර ගැනීමට ඉවහල් වනු ඇති" යි පැවසීය. "දැනටමත් නව රජය වෙනුවෙන් සැකසූ දින සියයේ වැඩ පිලිවෙලක් අප සතුව ඇති අතර එය අගමැති වැඩ ඇරඹූ වහාම ඔහු අතට පත් කෙරෙනු ඇත. ප්‍රතිසංස්කරන වේගයෙන් සිදුවනු ඇත." ඔහු තව දුරටත් ප්‍රකාශ කලේ ය.

මාර්තු මාසයේ සියයට 33ක කඩා වැටීම ඇතුලුව ඉන්දීය අපනයනයේ සුවිසල් කඩා වැටීම උපුටා

දක්වමින් ඉන්දීය අපනය කරුවන්ගේ සංගමයේ සභාපති ඒ. සක්තිවේල් සංගමයේ සාමාජිකයින්ට බදු විරාමයක් ලබා දෙන ලෙස රජයට බල කර සිටියේ ය. "අපනය අංශය රැකියා අවස්ථා අරමුනු කරගත් කර්මාන්ත බැවින් ඉදිරි වසර 5ක කාලයක් බදු ගෙවීමෙන් අපව නිදහස් කල යුතුයි" සක්තිවෙල් පැවසීය.

රජය ඔවුන්ගේ සවි ගැන්වුන වරම මහා සංගතවල න්‍යාය පත්‍රය පෙරට තල්ලු කිරීමට යොදාගත යුතු යයි ඉල්ලා සිටීමේ දී මාධ්‍ය සංගතය ද ඒ තරමට ම ඒ කරුන අවධාරනය කරනු ලබයි. "මේ ඓතිහාසික ජයග්‍රහනය ප්‍රයෝජනයට ගන්න" නමැති හින්දුස්තාන් ටයිම්ස් පුවත්පතේ කතුවැකිය ඒ සම්බන්ධ ආකෘතියක් වී ඇත. ඔවුනොවුන් අතර කට්ටිවාදී අරගල, ජනතාවාදී පොරොන්දු ආදිය මගින් මහා සංගතවල න්‍යාය පත්‍රයට එදිරිව සිටින අවස්ථා උදා කල ප්‍රදේශීය සහ කුල පදනමේ වන පක්ෂවල බලය පිරිහී යාම, වැඩිමනත්ම ස්ටැලින්වාදීන් ප්‍රමුඛ වාමාංශික පෙරමුනේ පාර්ලිමේන්තු සහාය, යූපීඒ බලයේ සිටි පලමු වසර 4 තුල සිදු වූවාක් මෙන්, රැක ගැනීමට වෙහෙස වීමෙන් කොංග්‍රසය "නිදහස්" වීම ගැන එය මහත් උද්යෝගයෙන් හඬ තැලීය. "තෙවන හා සිව්වන පෙරමුනු දියබත් වී යාමේ දී ඒවා සපයා ලූ විකල්ප පැවතියේ මොනවාට ද යන්න හෙලිදරව් වී ඇත; ඔවුන් හොඳම තත්ත්වයෙන් ගත් කල වෘත්තීය විරුද්ධත්වය ප්‍රකාශ කරන්නෝ ය; නරකම තත්වයෙන් ගත් කල කිසිදු විශ්වාසයක් රැඳවිය නොහැකි ක්‍රියාකාරීහු ය. නමුත් දැන් වාමාංශය වැනි එවන් පිලිල යූපීඒ ගෙල වටා එල්ලා නැති කල, කොංග්‍රසය ප්‍රමුඛ රජය ප්‍රතිසංස්කරන වායුව මත වඩවඩා දැඩිව පය රඳවා ගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු." හින්දුස්ථාන් ටයිම්ස් පත්‍රය ප්‍රකාශ කලේ ය.

එසේ ම ජූනි අවසානයේ හෝ ජූලියේ අයවැයකින් අරඹමින් කොංග්‍රස් නායකත්වය සිය පිලිවෙත පෙරට ගෙනයාම ගැන කිසි සේත්ම සැකයක් නැත. "ආර්ථික ප්‍රතිසංස්කරන අනිවාර්යයෙන්ම රජයේ න්‍යාය පත්‍රයේ ඉහලින්ම තිබෙනු ඇතැයි" අගමැති ආර්ථික උපදේශක කවුන්සිලයේ සභාපති සුරේෂ් තෙන්ඩුල්කාර් මැතිවරන ප්‍රතිඵල ගැන අදහස් දක්වමින් පැවසුවේ ය.

ඔබාමා පරිපාලනය ද කොංග්‍රසය ප්‍රමුඛ යූපීඒ නැවත පත්වීම සාදරයෙන් පිලිගත්තේ ය. රොබට් බ්ලේක්, දකුනු හා මධ්‍යම ආසියාව සම්බන්ධයෙන් රජයේ නිලධරයා ලෙස ඔහුගේ පත්වීම සම්බන්ධයෙන් එක්සත් ජනපද සෙනෙට් සභාව ඉදිරියේ කරුනු දැක්වීමක දී "එක්සත් ජනපදයත් ඉන්දියාවත් අතර පවතින මූලෝපායික සබඳතා තවත් දැඩි කිරීමට" වොෂිංටනය ලගදීම යෝජනා කරන බව ප්‍රකාශ කලේ ය.

ඉන්දියාවට එරෙහි ජාත්‍යන්තර න්‍යෂ්ටික සම්බන්ධතා බිඳ දැමූ සහ ගෝලීය සබඳතාවයක් ගොඩනගා ගැනීමක් ලෙස වොෂිංටනය හා නව දිල්ලිය විසින් දකිනු ලබන ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුම යූපීඒ ආන්ඩුවේ ප්‍රථම පාලන කාලය තුල ලබා ගත් ජයග්‍රහන සංඛේතවත් කිරීමක් ලෙස ඉන්දියානු ප්‍රභුව විසින් සලකනු ලබයි.

## කොංග්‍රසය හා භාරතීය ජනතා පක්ෂය

කොංග්‍රස්/යූපීඒ ජයග්‍රහනයට සාධක කිහිපයක් හේතු විය.

අපනය ක්ෂේත්‍රයේ නැගීමක සහ විදේශීය ආයෝජන ගලා ඒමේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය පස් වසර තුල ඉන්දියාව සියයට 9ක ආර්ථික වර්ධන වේගයක් අත් දුටුවේ ය. මෙම වර්ධනයේ ඵලය වැඩිමනත්ම සමාජයේ වරප්‍රසාදිත කොටස් වෙත ගලා ගියේ ය. එසේම පසුගිය දශක දෙක තුල දී නව ලිබරල්වාදී ප්‍රතිසංස්කරන මගින් ඉතා බරපතල බලපෑමක් ඇති කල නගරයේ වෙසෙන පවුල් සාමාජිකයින් වැඩි වැඩියෙන් එවනු ලබන මුදල්, හෝ මෝසම් වැසි හොඳින් ලැබීම හා ප්‍රමානවත් තරමකින් කෘෂිකාර්මික අංශයේ හා සමාජීය වියදම්වල රාජ්‍ය ආයෝජන ඉහල යාම හේතුවෙන් ජනගහනයෙන් බහුතරයක් ජීවත්වන ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශ මෑත වසරවල දී යම් තාක් දුරක ප්‍රගතියක් අත් කර ගත්තේ ය. නය ගැති ගොවීන්ගේ නය කපා හැරීමේ වැඩ සටහන සහ සෑම දිලිඳු පවුලක ම එක් සාමාජකයෙකුට වසරක අවම වැටුප, එනම් දින 100ක අවම වැටුපක්, ලබා දෙනු ලබන ජාතික ග්‍රාමීය රැකියා සහතික කිරීමේ වැඩ පිලිවෙල ග්‍රාමීය ප්‍රදේශවල අන්ත කර්කශ තත්ත්වය යම්තාක් දුරකට සමනය කිරීමේ අර්ථයෙන් ගත් කල විශේෂ වැදගත් කමක් ගනී.

පසුගිය මාස 7 තුල කාර්මික නිෂ්පාදනයේ හා ආනයනයේ තියුනු කඩාවැටීමක් ද ආර්ථික වර්ධනයේ නාටකීය පහත වැටීමක් ද දක්නට ලැබුනි. නමුත් ඉහල හා "වේගවත්" ආර්ථික වර්ධනයක් කරා නැවත ඉන්දියාව ගෙන යාමට ඇති හොඳම පක්ෂය යූපීඒ බවට කොංග්‍රසය කල ප්‍රකාශය බොහෝ දෙනා පැහැදිලිව ම පිලිගෙන ඇත.

එසේම කොංග්‍රස්/ යූපීඒ ජයග්‍රහනය තුල විරුද්ධ පක්ෂයට එරෙහි මහජන ප්‍රතික්‍රියාව ඒ තරමට ම වැදගත් ය.

බීජේපීය වර්ගවාදයෙන් පිරුනු දක්ෂිනාංශික ව්‍යාපාරයක් ගෙන ගියේ ය. එය ත්‍රස්තවාදය සම්බන්ධයෙන් "මෘදුව" සිටි යයි කොංග්‍රසයට පහර දුන්නේ ය. දේශ සීමා හරහා පකිස්තානයට ප්‍රහාර එල්ල කිරීමේ ශක්‍යතාවය ද ඇතුලත්ව බීජේපී ආන්ඩුවක් "ශක්තිමත්" විදේශ ප්‍රතිපත්තියක් ඇති කරනු ඇති බව නිවේදනය කරන අතර එල් කේ අද්වානි හා නරේන්ද්‍ර මොදි බීජේපීයේ වර්තමාන හා අනාගත මුහුනු ලෙස පෙරට දමා ඇත.

ෆැසිසිට්වාදී ආර්එස්එස් පක්ෂයේ යාවජීව සාමාජිකයෙක් වන අද්වානි ඉන්දියාව තුල 1947 බෙදීමෙන් පසු සිදුවූ විශාලතම වාර්ගික ලේ වැගිරීම් රැල්ල මධ්‍යයේ 1992-93 දී කුලුගැන්වුනු ප්‍රසිද්ධ අයෝධ්‍යා මුස්ලිම් පල්ලි භූමියේ මිත්‍යා දෙවි රාම් වෙනුවෙන් දේවාලයක් ඉදිකිරීමේ උද්‍යෝෂනය මෙහෙය වී ය. ගුජරාට මහ ඇමති මොදි 2,000කට මරු කැඳවූ හා තවත් 100,000ක් පමන අවතැන් කරවූ මුස්ලිම් විරෝධී ව්‍යාපාරයන් 2002 දී අවුලුවාලී ය.

ඉන්දීය ජනතාව පැහැදිලිව ම බීජේපී ප්‍රතික්ෂේප කලේ ය. 1989 මැතිවරනයෙන් පසු දුර්වලම ප්‍රතිඵල පෙන්නුම් කරමින් ආසන 116ක් පමනක් දිනා ගත් අතර එන්ඩීඒ හවුල ආසන 174 සිට 158 දක්වා වැටුනි. දිල්ලිය හ බොම්බාය ද ඇතුලු මූලික නාගරික කේන්ද්‍රවල දී බීජේපියටත් එහි මහාරාෂ්ට්‍ර මිත්‍ර පාක්ෂික සිව්සේනා පක්ෂයටත් අනුග්‍රහය අඩු විය. පසුගිය වසර තුල දී දකුනු ඉන්දියානු ප්‍රාන්තයක (කර්නාටක) ප්‍රථම වරට බීජේපීය තම සංවිධානය පිහිටුවා ගත් අතර එසේ නොමැති වූයේ නම් එයට ලැබෙන සහයෝගය සම්පූර්නයෙන්ම වාගේ උතුරු හා බටහිර ඉන්දියාවට සීමා වී තිබේ. එහි බොහෝමයක් මන්ත්‍රීවරුන් ආර්ථිකව පසුගාමී හා නොතකා හරින ලද මධ්‍ය ප්‍රදේශ්, චතිස්ගාර්, ජාර්කන්ද් හා බිහාර් වැනි ප්‍රාන්තවලින් පැමිනෙන්නෝ වෙති.

බීජේපීයේ පරාජය පරිමාව පැහැදිලිව ම පෙනෙන්ට ගත් විට පසුගිය සෙනසුරාදා අද්වානි නිල විපක්ෂ නායක ධුරයෙන් ඉල්ලා අස්විය.

1966 පටන් සෑම රජයක් ම පිහිටුවීමේ දී තීරනාත්මක භූමිකාවක් රඟපෑ 1980 ගනන්වල දී පැන නැගුනු ප්‍රාන්ත සහ කුල පදනමේ පිහිටි පක්ෂවලට එරෙහි ප්‍රහාරයක් මෙම මැතිවරන ප්‍රතිඵල නිරූපනය කලේ ය. මේවා අතර අන්ද්‍රා ප්‍රදේශ් පදනම් වූ තෙලිගු දේසම් පක්ෂය (ටීඩීපී) බිහාරයේ රාෂ්ටීය ජනතා දාල් (ආර්ජේඩී) හා දලිත් (පෙර සිටි සියලුම කුලහීන) වරුන් හා සියලුම පීඩිතයින් නියෝජනය කරන්නේ යයි වංචනිකව කියා සිටින බහුජන් සමාජ් පක්ෂය (බීඑස්පී) ය වේ. මේ පක්ෂවල අනුග්‍රහය බාදනය වී ඇති නම් එසේ වූයේ ගිජු හා දූෂිත ප්‍රාදේශීය ප්‍රභූන්ගේ වාහනය වන බවට වූ පොදු පිලිගැනීමත් එසේ ම ඔවුන්ගේ ජනහිතවාදී කයිවාරු තිබියදීම ඉන්දියාව විදේශීය ආයෝජන ඇදගන්නා කාන්දමක් හා ලෝක ධනවාදය වෙනුවෙන් ලාබ ශ්‍රම නිෂ්පාදකයෙකු කිරීමේ ධනපති ව්‍යාපාරය අවංකවම ක්‍රියාවට නැංවීමත් හේතුවෙනි.

ස්ටැලින්වාදී වාමාංශික පෙරමුනට අන්ත පරාජයක්

කෙසේ වෙතත් මැතිවරනයේ අන්තම පරාජිතයා අවිවාදයෙන් ම ඉන්දියාවේ කොමියුනිස්ට් පකෂය (මාක්ස්වාදී) (සීපීඑම්) හා එහි වාමාංශික පෙරමුනයි. ලෝක් සභාවේ ඔවුන්ගේ නියෝජනය අඩකින් පමන කප්පාදු විය. ධනපතියන්ගේ "නව ආර්ථික ප්‍රතිපත්තියේ" ප්‍රතිඵලයක් ලෙස ඉහල නැගුනු ආර්ථික අනාරක්ෂිතභාවය හා සමාජ අසමානතාවයට එරෙහි පොදු ජන කෝපයේ රැල්ලක් සමග වසර 5කට පෙර සීපීඑම් හා වාමාංශික පෙරමුන ඔවුන් මෙතුවක් ලබා ගත් ඉහල ම ප්‍රතිඵල අත් කර ගත්හ.

මැතිවරනය අවසන් වනවාත් සමග ම ස්ටැලින්වාදීන් ඉන්දීය ධනපති පන්තියේ සම්ප්‍රදායික පාලක පක්ෂය වන කොන්ග්‍රසයේ අත්උදව්කරුවන් ලෙස ක්‍රියා කරමින් කම්කරු පන්තියත් ගොවි ආධාරකරුවනුත් පාවා දෙන ලදී. සීපීඑම් හා ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය බීජේපීයට එරෙහිව "අනාගමික" කොංග්‍රසයට සහාය දැක්වීම අත්‍යාවශ්‍ය වන බව ප්‍රකාශ කරමින් කොංග්‍රසය සමග යූපීඒ නිර්මානය කිරීමට අනෙක් පක්ෂ ඒත්තු ගන්වා ගැනීමට උපකාර කලේ ය. "මානුෂික මුහුනුවරකින් යුත් ප්‍රතිසංස්කරන" කරගෙන යා හැකි යයි ද, ඉන්දීය වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂා ස්වයං-ධනවත් වීමේත් ඉන්දියාව ප්‍රධාන බලවතෙක් බවට පත් කිරීමේ ත් ඉන්දියානු ධනපති පන්තියේ ධාවනය සමගින් සම්බන්ධ කල හැකි යයි කියමින් කොංග්‍රසය කරන ප්‍රකාශය මූර්තිමත් කරන යූපීඒ "පොදු අවම වැඩ පිලිවෙල" (සීඑම්පී) සැලසුම් කිරීමේ දී ස්ටැලින්වාදියෝ ප්‍රධාන භූමිකාවක් ඉටු කලහ..

වාමාංශය තම රජයේ හවුල්කරුවන් කර ගැනීමට කොංග්‍රසය උත්සුක වූයේ පාර්ලිමේන්තු ගනන්බැලීම් එකම හෝ ප්‍රධාන කාරනාව කරගෙන නොවේ. කොන්ග්‍රසය අනපේක්ෂිත ලෙස මුදුනට ම නංවාලූ 2004 මැතිවරනය ධනපති පන්තියේ පන්ති මූලෝපායන්ට එරෙහි සුවිසල් මහජන විරෝධතාවයක් නිශ්චිතව ම අඟවන බව හඳුනාගත් ඔවුන්ට "ජනතාවාදී" මුහුනුවරක් ලබා ගැනීමටත් එමගින් ඉන්දියානු ප්‍රාග්ධනයට එරෙහිව පවතින තර්ජනාත්මක තත්වය නිශ්ක්‍රිය කර දැමීමටත් ස්ටැලින්වාදීන් යොදවා ගැනීමට උත්සුක විය.

පෙර පැවති බීජේපීය මූලික එන්ඩීඒ රජයේ ප්‍රතිපත්තිවලට ඉතා සුලු වශයෙන් පමනක් වෙනස් කොංග්‍රසය විසින් පවත්වා ගෙන ගිය දක්ෂිනාංශික සමාජ ආර්ථික හා විදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් විරෝධය දැක්වූවත්, සුලුතරයක්ව සිටි යූපීඒයට ඊලඟ සිව් වසර තුල බලය රැක ගැනීමට අවශ්‍ය ඡන්දය වාමාංශය ලබා දුන්නේය.

අවසානයේ දී වාමාංශික පෙරමුන ඉන්දු-එක්සත් ජනපද න්‍යෂ්ටික ගිවිසුමට සහාය දීම ප්‍රතික්ෂේප කල පසු ඉන් ගැලවීමට කොංග්‍රසය තීන්දු කලේ ය.

ඒ අතරතුරේදී, වාමාංශික පෙරමුන, ඔවුන් බලයේ සිටි ප්‍රාන්තවල දී කම්කරුවන්ගේ සටන්කාමිත්වය මැඩලමින් (වැඩ වර්ජන තහනම් කරන නීති යොදා ගැනීම ද ඇතුලත්ව) බදු කපා හරිමින්, සහ විශේෂ

ආර්ථික කලාප පිහිටුවමින් දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂනය කර ගැනීමට බලා පොරොත්තු වීමත් සමගින් ම කම්කරු පන්තිය හා ගොවීන් සමග විවෘත සට්ටනයකට එලැඹුනි. බටහිර බෙංගාලයේ දී නන්දිග්‍රාම් හා සින්ගුර් හි විශේෂ ආර්ථික කලාප සඳහා ගොවි ඉඩම් පවරා ගැනීමට එරෙහි මහජන විරෝධය මැඩ පැවැත්වීමේ අසාර්ථක උත්සාහයක දී ස්ටැලින්වාදියෝ ලේ වැකි පොලිස් හා ඝාතක කල්ලි ප්‍රචන්ඩත්වය යොදා ගත්හ.

2004 දී සීපීඑම් දිනා ගත් ආසන 43 ඇතුලත්ව වාමාංශික පෙරමුන ආසන 61ක් දිනා ගත්තේ ය. වසර 5කට පසු සීපීඑම් දිනා ගත්තේ ආසන 17ක් පමනක් වන අතර මුලු වාමාංශික පෙරමුන ම දිනා ගත්තේ ආසන 24ක් පමනි. 1951 න් පසු කිසි දිනෙක ස්ටැලින්වාදියෝ මෙතරම් අඩු සංඛ්‍යාවක් තේරී පත් නොවූහ.

වාමාංශික පෙරමුන වසර 32ක් බලය දැරූ බටහිර බෙංගාලයේ දී, 2004 දී දිනා ගත් ආසන 35 සමග සැසඳූ විට මෙවර දිනා ගත්තේ ආසන 14කි. ස්ටැලින්වාදීන් එල්බීගත් දක්ෂිනාංශක ප්‍රතිපත්ති, ප්‍රති-කොමියුනිස්ට්වාදී වාචාලයෙකු හා බීජේපී පාක්ෂිකයෙක්ව සිටි මමතා බැනර්ජි නායකත්වය දෙන ත්‍රිනමුල් (සාමාන්‍ය ජනයා) කොංග්‍රසයට "මහා සංගත-ගැති" වාමාංශයට එරෙහිව වැඩ කරන ජනතාවගේ ආරක්ෂකයා හැටියට පෙනී සිටීමට හැකියාව ලබා දුනි.

කේරලයේ දී, කොංග්‍රසය ප්‍රමුඛ රජය මගින් ගෙන ගිය "ප්‍රතිසංස්කරන" වලට එරෙහි විරෝධතා රැල්ලක් මත්තෙන් ප්‍රාන්ත මට්ටමින් 2006 දී නැවත බලයට පත්වූ වාමාංශික පක්ෂය කොංග්‍රසය හා එහි මිත්‍ර පක්ෂ ආසන 15ක් අල්ලා ගනිද්දී වාමාංශය ලබා ගත්තේ ලෝක් සභා ආසන 4ක් පමනි.

□ □□□.□□□□.□□□

පසුගිය ජුලියේ දී කොංග්‍රසය විසින් කුනුකුඩයට දැමූ නිසා ස්ටැලින්වාදියෝ ප්‍රති-කොන්ග්‍රස්, ප්‍රති-බීජේපී තෙවන පෙරමුනක අදහස ඉස්මතු කලහ. කම්කරු පන්තියේ අවශ්‍යතාවල ආස්ථානයෙන් මෙය දේශපාලනික ගර්හාවක් වූයේ ය. ස්ටැලින්වාදියෝ සියලුදෙනා ම කොංග්‍රසයේ හෝ බීජේපීයේ පාක්ෂිකයන්ව සිටි කුල හා ප්‍රදේශ පදනමේ දක්ෂිනාංශික පක්ෂ පෙලක් එක හුයකින් ගැටගසා ඔවුනට " අනාගමික, ජනතා ලැදි" රජයක පදනම පිහිටුවාලිය හැකි යයි ප්‍රකාශ කරති.

තමිල්නාඩුවේ දී, ඒඅයිඩීඑම්කේ පක්ෂය වැඩ වර්ජන කඩාකප්පල් කරුවන් යොදා ගනිමින් හා දස දහස් ගනන් කම්කරුවන් බුරුතු පිටින් රැකියාවලින් නෙරපා හරිමින් තමිල්නාඩු රජයේ කම්කරුවන්ගේ වර්ජනය බිඳ දැමූ බව පෙන්වා දෙමින් කොංග්‍රසයත් එහි හවුල්කරු ඩීඑම්කේ පක්ෂයත් වාමාංශය ගර්හාවට ලක් කලේ ය.

ඡන්ද ගනන් කිරීම අවසන් වීමටත් පෙරාතුව ම ඒඅයිඩීඑම්කේ, ටීඩීපී, හා ජේඩී(එස්) ඇතුලත්ව තෙවන පෙරමුනේ කොටස්කරුවන් කිහිප පොලක්ම ගිලෙන නැවෙන් පිටට පැන කොංග්‍රසයට හෝ බීජේපීයට එකතු වීමට සූදානම් වූහ.

මැතිවරන ප්‍රතිඵලවලට ප්‍රතිචාර දක්වමින් "අප විශාල පසුබෑමකට මුහුන දී ඇතැයි ද මෙය පක්ෂයේ දුර්වල ක්‍රියාකාරිත්වය පිලිබඳව බරපතල විභාග කිරීමක් අත්‍යාවශ්‍ය කර ඇතැයි" ද සීපීඑම් ප්‍රධාන ලේකම් ප්‍රකාශ් කරාත් පැවසුවේ ය.

පක්ෂයේ නායකත්වය, විශේෂයෙන්ම මහා සංගත සමග ලෙන්ගතු සබඳතා ගොඩනගාගත් බටහිර බෙංගාලයේ නායකතවය, පසුගිය ගිම්හානයේ කොංග්‍රසය ප්‍රමුඛ යූපීඒය ට ලබා දුන් පාර්ලිමේන්තු සහාය ඉවත් කර ගැනීමට විරුද්ධ වූ බව සාමාන්‍යයෙන් දන්නා කාරනයකි. සීපීඑම් හි හිටපු නීති සම්පාදක සොම්නාත් චැටර්ජි, කරාත් ඉල්ලා අස් විය යුතු යයි ප්‍රසිද්ධියේ ම කියා සිටියේ ය. වාමාංශික පෙරමුන යූපීඒයේ ආධාරයට පෙල ගැසෙද්දී ඇති කර ගත් සැලසුම්වල කොටසක් ලෙස චැටර්ජි ලෝක් සභා කථා නායක ධුරයට නම් කෙරුනේ ය.. වාමාංශය යූපීඒට දුන් සහාය ඉවත්කර ගත් පසුත් කථානායක ධුරයෙන් අස්වීම ප්‍රතික්ෂේප කල බැවින් ඔහුව පක්ෂයෙන් නෙරපා දැමුවේය.

ස්ටැලින්වාදීන්ගේ සහාය ඇතිව, අර්බුද කිහිපයකින් තොරව ම නොවුනත්, පන්ති අරගලය මත ඇබයක් ගසා හිර කරමින්, පෙර නුවූ විරූ ආර්ථික වර්ධනයක තතු යටතේ පසුගිය වසර 5 තුල මහා සංගතවල න්‍යාය පත්‍රයක් ක්‍රියාවේ ලීමට කොන්ග්‍රසය ප්‍රමුඛ යූඒපීයට හැකි විය. දෙවන යූපීඒ රජය, බලයට පත්වන්නේ කම්කරු පන්තිය හා පීඩිත ජනතාව සමග වේගවත් ගැටුමක් කරා ගෙන යනු ලබනා පරිවර්තනය වූ කොන්දේසි යටතේ ය. දැනටමත් ලෝක ආර්ථික අර්බුදය, විස්මයාකාර ආර්ථික වර්ධන වේගයේ කඩා වැටීමක් හා විරැකියාවේ වේගවත් නැග්මක් නිර්මානය කර තිබේ. මෙයට ප්‍රතිචාර දක්වමින් මහා සංගත ආයෝජන ගැති ප්‍රතිසංස්කරන වේගවත් කිරීමට බලකර සිටිනවා පමනක් නොව දැනට දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 12ක්ව ඇති රජයේ අයවැය හිඟය තියුනු ලෙස කප්පාදු කර ගැනීමට, රාජ්‍ය වියදම් කපා හැරීමට රජය වහාම පියවර ගත යුතු යයි බල කර සිටිනු ඇත.

© www.wsws.org